00036

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා ) උපාධි වැඩසටහන - හයවන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2015**

**අධ්‍යාපන කළමනාකරණය – ESU4115**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2015 අප්‍රේල් 06** **වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. "අධ්‍යාපන කළමනාකරණය" යන්න සුදුසු නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න.

02. F.B.ටේලර් විසින් හඳුන්වා දෙන ලද විද්‍යාත්මක කළමනාකරණ න්‍යායයේ ඇතුළත් මූලික අදහස් දෙකක් (02) විස්තර කරන්න.

03. කළමනාකරණ ක්‍රියාවලියේ මූලිකාංග නම් කරන්න.

04. විදුහල්පතිගේ නාමික නායකත්ව භූමිකාව සැකෙවින් පැහැදිලි කරන්න.

05. I C වර්ගයේ පාසලක සංවිධාන ව්‍යුහය ඇඳ දක්වන්න.

06. "කළමනාකරණය" හා "පරිපාලනය" වෙන්කර දක්වන්න.

07. පාසල් සංවර්ධන සමිතියේ කාර්යයන් දෙකක් (02) ක් සැකෙවින් විස්තර කරන්න.

08. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණයේ සංවිධාන ව්‍යුහය ඇඳ දක්වන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) " පාසල් පාදක කළමනාකරණය " යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) වර්තමාන පාසල් පද්ධතියට පාසල් පාදක කළමනාකරණය හඳුන්වාදීමේ වැදගත්කම කරුණු 04 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) පාසල් පාදක කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී විදුහල්පතිවරුන් මුහුණ දෙන ගැටලු හතරක් (04) නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

10. (i) "අධීක්ෂණය" යන්න සුදුසු නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සායනික අධීක්ෂණයේදී, අධීක්ෂකගේ සහ අධීක්ෂිත ගේ භූමිකාවන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(iii) ඉගෙනුම් ක්‍රියාවලිය සුසාධ්‍ය කිරීමේ ලා සායනික අධීක්ෂණයක වැදගත්කම කරුණු හතරක් (04) ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

11. (i) පාසලක "අභ්‍යන්තර කාර්යක්ෂමතාව" හා "බාහිර කාර්යක්ෂමතාවය" යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) පාසලේ ඵලදායීතාවය වර්ධනය කිරීමේ ලා, පාසලේ අභ්‍යන්තර කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමෙන් ඇතිකළ හැකි බලපෑම නිදසුන් 03 ක් ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

12. (i) " නායකත්වය " යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) පාසලේ විදුහල්පති සතු "බලය" හා "අධිකාරිය" නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(iii) පාසල් කළමනාකරණ ක්‍රියාවලියේ දී පාසල් නායකයා ලෙස විදුහල්පතිවරුන් මුහුණ දෙන ගැටලු හතරක් (04) සාකච්ඡා කරන්න. (ලකුණු 08)

13. (i) මැක්ස් වෙබර් විසින් හඳුන්වා දෙන ලද නිලබලතන්ත්‍රවාදී ආකෘතිය හඳුන්වන්න.

(ලකුණු 05)

(ii) "පාසල තුළ නිළබලතන්ත්‍රවාදී ක්‍රමය භාවිත කිරීම වඩා උචිත වේ." මෙම ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 15)

14. (i) පහත මාතෘකා අතරින් ඕනෑම දෙකක් (02) පිළිබඳව සටහන් ලියන්න.

(i) බ්ලේක් සහ මවුටන් ගේ කළමනාකරණ දැලිස හා පාසලට එහි අදාළත්වය

(ii) මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය හා පන්ති කළමනාකරණ ක්‍රියාවලිය

(iii) පාසලේ ශ්‍රේණි සමායෝජක ගුරුවරයාගේ භූමිකාව

(iv) පාසල් සංවිධානය විවෘත පද්ධතියක් ලෙස

(v) පාසල් කළමනාකරණ ක්‍රියාවලියට ගුරුවරයාගේ දායකත්වය

(ලකුණු 10 x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -